හැටන් ශාන්ත ජෝසප් දමිළ පාසල - මස්කෙළිය

2009 ජූලි මස **8** වන දින මධ්‍යම පළාතෙහි හැටන් ජෝන් බොස්කෝ විද්‍යාලයෙහි ප්‍රධාන ගුරුවරුන් සඳහා වන පුහුණුවක් ආරම්භ විය. එය ද්විතීක අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතියෙහි මධ්‍යම පළාතෙහි කළමණාකාරතුමා වන තිලක් ඒකනායක මහතා විසින් පුහුණුව ආරම්භ කරන ලදී.

හැටන් අධ්‍යාපන කලාපය, නුවරඑළිය අධ්‍යාපන කලාපය හා කොත්මලේ අධ්‍යාපන කලාපය යන අධ්‍යාපන කලාප තුනකින් ගුරුවර ගුරුවරියන් විසිහත් දෙනෙකු පුහුණුවට පැමිණ සිටියහ .මොවුන් සියල්ලන්ම වාගේ වැඩි වයසක් නොවන තරුණ පිරිසක් විය.

පුහුණුව පැවැති දින අට තුල සියල්ලන්ම නොකඩවා පුහුණුවට සහභාගී විය. ඉගැන්වීම් කාර්යයේදී පරිගණකය මෙවලමක් ලෙස භාවිතා කිරීමට **Intel® Teach** වැඩ සටහනෙන් ඉගෙනගත් ඔවුන් නිතරම උගන්වන දෙයට වඩා තවත් අලුත් දේවල් අසා දැනගත්තෝය .එම නිසාම සමහර ගුරුවරුන් තම පාසලට අදාල වෙබ් අඩවිය නිර්මාණය කර, අන්තර්ජාලයේ එය **Upload** කිරීමද කලේය.

මේ අකාරයට ඉතාමත් උද්යෝගී අන්දමින් දින අටක පුහුණුව නිමා විය. පසුව මාසයක් පමණ යන විට මේ ගුරුවරුන් තම පාසලේ පුහුණු කිරීම් ආරම්භ කළ අතර මස්කෙළියේ පිහිටි ශාන්ත ජෝසප් දමිළ මහා විදුහලෙන් පැමිනි ගුරුවරියන් වන ජී. සසිකලා මෙනවිය සහ පී. එම්. එස්. නිශා මෙනවිය ද විය. මෙම පුහුණුවට පෙර පාසලේ පරිඝණක මධ්‍යස්ථානය අනෙකුත් ගුරුවරුන් විසින් නිතර නිතර ප්‍රයෝජනයකට ගත්තේ නැත. එය ළමුන් සඳහාම හෝ තොරතුරු තාක්ෂණ විෂය සඳහාම නිල නොලත් ආකාරයට වෙන් කර තිබුනි. ජී. සසිකලා මෙනවිය සහ නිශා මෙනවිය හමුවද බොයෝ විට කතා කලේ, තම පාසලේ ආභරණයක් බඳු පරිගණක මධ්‍යස්ථානයෙන් උපරිම ප්‍රයෝජන ගත හැකි ක්‍රම පිළිබඳවය.

“නායකයා සැමගේ සේවකයා වන්නා සේම, කිසියම් වූ අරමුණක් කරා තම පිරිවර ගෙනයන විට පෙරමුණ ගත යුතුය.”

මෙහිදී අනිවාර්යයෙන්ම සඳහන් කල යුතු කාරණයක් නම්, එස් .රාමයියා වන පාසලේ විදුහල්පතිතුමාගෙන් ලැබුනු සහයෝගය නම් කිසිසේත්ම අමතක කල නොහැකි වීමයි . ප්‍රථමයෙන්ම විදුහල්පතිතුමා ගුරු රැස්වීමක් පවත්වා කණ්ඩායම් දෙකට ගුරුවරුන් හතලිස්දෙනෙකු නම් කළේය. එසේම විදුහල්පතිතුමා පාසලේ ගුණාත්මක යෙදවුම් වලට වෙන් කර අති මුදල් වලින් ගුරුවරුන්ට අවශ්‍ය කුඩා උපකාරක පොත් සකස් කර දීමට ද සියළු කටයුතු සකස් කර දුන්නේය.

පරිසණක සංඛ්‍යාව විස්සක් පමන මෙම පාසලේ ඇති නමුත් දින කීපයක් තුලදිම ගුරුවරුන් හතලිස්දෙනාවම, විසිදෙනා බැගින් වූ කණ්ඩායම් දෙකකින් සාර්ථකව පුහුණු කෙරුනි.මෙහිදි පරිගණක භාවිතයට මෙන්ම අන්තර්ජාලය පරිහරනයට ද සිය ගුරුවරුන් යොමුවන අයුරු දුටු විදුහල්පතිතුම මවිතවිය.

එස්.රාමයියා මහතා-විදුහල්පති

මෙතෙක් කල් සිසුදරු දැරියන් නිසා ජනාදරයට පත්වී සිටි ශා. ජෝසප් විද්‍යාලය, ගුරුවරුන් නිසා ප්‍රදේශයේ කතාබහට ලක් වන්නට විය.

එම නිසාම අසල්වැසි පාසල් කීපයකිනම ලැබුනු ආරාධනාවන් අනුව, තවත් ගුරුවරුන් 40 දෙනෙකු පුහුණුවීම සඳහා ඉල්ලුම් කරන ලදී. පසුව නැවතත් විසිදෙනා බැගින් වූ කණ්ඩායම් දෙකක් පුහුණු කිරීමට සියළු පහසුකම් විදුහල්පතිතුමා විසින් සලසා දුන්නේය. විදුහල්පතිතුමා අවට පාසල් වල විදිහල්පතිවරුන්ව ලිපි මගින් දැනුවත් කිරීමෙන් තවත් ගුරුවරුන් සූදානම් කරන ලදී. තවත් විශේෂත්වයක් වන්නේ මෙම පුහුණුවට පාසලේ විදුහල්පතිතුමා සහ අවට පාසල් කිහිපයක විදුහලපතිවරුන්ද සහභාගීවීමයි. කෙසේ හෝ මෙම කණ්ඩායම් දෙකද දින කිහිපයක් ඇතුලත සසිකලා මෙනවිය සහ නිශා මෙනවියගේ අති මහත් කැපවීම මත සාර්ථකව නිමා විය.

අවසානයේ දී මොවුන් ගුරුවරු අසූදෙනෙකු සාර්ථකව පුහුණු කර තිබුනි .එයින් මෙම පාසල අද වන විට **Intel® Teach** වැඩසටහන තුල ගුරුවරුන් වැඩිම සංඛ්‍යාවක් පුහුණුකර මුලු ශ්‍රී ලංකාවෙන්ම ප්‍රථම ස්ථානය හිමිකර ගෙන තිබේ .මේ සියල්ලම කරගත හැකි වූයේ එම පාසලේ ප්‍රධාන පුහුණුකරුවන් දෙදෙනාගේ සහ විදුහල්පතිතුමාගේ තිබූ මහත් කැපවීම නිසාය.

තවත් විශේෂත්වයක් වන්නේ එම පුහුණුව ලබා දීමෙන් අනතුරුව ඔවුන් සිසුනට ඉගැන්වීමේ දී පරිගණකය ඉගෙනුම් ආධාරකයක් බවට පත් කිරීමට පෙළඹී සිටින අතර ඒනිසා තවදුරටත් පාසල් පරිගණක ඒකකය යනු හුදකලා ඒකකයක් නොවී පාසල් අධ්‍යාපන අභිමතාර්ථ

සාධනය කර ගැනීමෙහිලා වැදගත් දායකත්වයක් ඉටු කරන අංශයක් බවට පත් විය. මෙම පුහුණුවෙන් පසුව වෙනදාට පාසලේ පරිසණක මධ්‍යස්ථානයට වැඩිය නොපැමිණි ගුරුවරුන් එය භාවිතයට ගනීමයි.එසේම ගුරුවරුන්ට පාඩම් සඳහා අවශ්‍යය බහුමාධ්‍යය ඉදිර්පත්කිරීම්,

ප්‍රශ්න පත්‍ර වැනි දෑ තනිවම සකස් කර ගැනීමට පෙලඹී තිබේ .එසේම ළමුන්ව පන්ති කාමරයෙන් පරිසණක මධ්‍යයස්ථානය වෙත රැගෙන ගොස් විවිධ පාඩම් සිදු කර ගැනීමට පෙලඹී ඇත.

පී. එම්. එස්. නිශා මෙනවිය

Intel® Teach වැඩ සටහන තුලින් ඉතා සාර්ථක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් හා ගුණාත්මක වර්ධනයක් ඇති කරලීමට ලැබීම ගැන ඔවුන් සිටින්නේ සතුටිනි. මේ ආකාරයට ඔබටත් කැප වීමට හැකිනම්, ඔබගේ පාසල ද මප/හැ/ශාන්ත ජෝසප් දමිළ පාසල සේ දිදුලන ස්ථානයක් කරා ගෙන යා හැක.

ශෂිකලා මෙනවිය

http://iteach.schoolnet.lk/SuccessStories/HPMT.htm